www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බටහිර බෙංගාල ස්ටැලින්වාදී තන්ත්‍රය ගොවි ජන ඝාතනයක් සිදු කරයි

## West Bengal Stalinist regime perpetrates peasant massacre

**ක්‍රාන්ති කුමාර විසිනි**
**2007 මාර්තු 16**

ඉන්දියානු හා විදේශීය ප්‍රාග්ධනයේ ලාභ අවශ්‍යතාවන් උදෙසා සරුසාර ගොවි බිම් අත්පත් කර ගැනීමේ සිය පිලිවෙතට විරුද්ධව නැගී සිටි ගොවි ජනයා ඝාතනයට ලක් කරමින් බටහිර බොංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව ප්‍රහාරයක් දියත් කොට තිබේ.

කොල්කොතාවේ (කල්කටාවේ) සිට කිලෝමීටර 150ක් පමන දුරින් පිහිටි නන්දිග්‍රාම් නගරාශ්‍රිත ප්‍රදේශයෙහි ආන්ඩුවේ අධිකාරය යලි ස්ථාපනය කරන ලෙස ස්ටැලින්වාදීන් නායකත්වය දෙන බටහිර බෙංගාල ප්‍රාන්ත ආන්ඩුව පසු ගිය බදාදා 4,000කට වැඩි භට සංඛ්‍යාවකින් යුත් පොලීස් බලඇනියකට අන කලේ ය. මේ බලඇනියට පැරා මිලිටරි භටයන්, ක්ෂනික ක්‍රියාකාරී හා කොමාන්ඩෝ භටයන් ඇතුලත් විය. ප්‍රහාරයෙන් 14කට ආසන්න ජනයා ඝාතනයට ලක් වූ අතර ගම්වාසීන් 75කට ආසන්න ප්‍රමානයක් තුවාල ලදහ.

ඉන්දුනීසියාව මූලස්ථානය කොට ගත් සලීම් ගෲප් නමැති සංගතයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වීමට නියමිත විශේෂ ආර්ථික කලාපයක් සඳහා ප්‍රදේශයේ ඉඩම් අක්කර 10,000ක් අත්පත් කර ගැනීමට ආන්ඩුව සැලසුම් කරන බව දැන ගැනීමෙන් අනතුරුව ජනවාරි මස මුල දී නන්දිග්‍රාම් ගොවීහු කැරැල්ලකින් නැගී සිටියහ. මහජනයා භීතියට පත් කොට විරෝධතා ව්‍යාපාරය වනසා දමනු වස් ජනවාරි 6-7 දා රාත්‍රියේ ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂ [සීපීඑම්] මැරයන් 200කට වැඩි පිරිසක් නන්දිග්‍රාමයට කඩා වැදුනේ පොලීසියේ නිහඬ සහාය ද ලබමිනි. අනතුරුව ඇති වූ ගැටුමෙන් පුද්ගලයන් හය දෙනෙකු මරනයට පත් වූ නමුත් අවසානයේ ගම්වාසීහු සීපීඑම් කුලී මැරයන් පලවා හැරියහ.

ආන්ඩුවේ නියෝජිතයන්ට නන්දිග්‍රාමයට ඇතුලු විය නොහැකි තත්ත්වයක් සහතික කර ගනු පිනිස ප්‍රදේශයේ මහජනතාව මංමාවත්වල වලවල් හාරමින්, පාලම් විනාශ කරමින් හා බාධක ගොඩ නගමින් සිටි තත්ත්වය තුල බදාදා වන තෙක් ප්‍රදේශය පැවතුනේ ආන්ඩු අධිකාරීන්ගේ "පාලනයට පිටතිනි."

සැම වාර්තාවකට ම අනුව, බදාදා ගැටුම කුඩා පරිමානයේ සිවිල් යුද්ධයක් විය. පොලීසිය තුන් පැත්තකින් ප්‍රදේශයට පිවිසුනු අතර පොලිස් භට කන්ඩායම් දෙකක් ජනයාගෙන් එල්ල වූ දරුනු ප්‍රතිරෝධයකට මුහුන පෑහ.

දෑකැති, මුගුරු, හා මන්නාවලින් සන්නද්ධ වූ දහස් ගනන් ගැමියෝ කීප සියයක ස්ත්‍රීන්ගෙන් හා ලමුන්ගෙන් සමන්විත ප්‍රාකාරයක් පිටුපස එක්රැස් වී සිටියහ. ඇතැම් වාර්තාවලට අනුව සමහර ගැමියෝ සිය නිවෙස්වල දී තනා ගත් දුම් බෝම්බවලින් හා ගම්බදව තනන පිස්තෝලවලින් ද සන්නද්ධව සිටියහ.

විසිර යන ලෙස පිරිසට බල කිරීම සඳහා පොලීසිය කඳුලු ගෑස් එල්ල කරමින් රබර් උන්ඩවලින් වෙඩි තැබී ය. එහෙත් ගම්වාසීන් ප්‍රතිප්‍රහාර එල්ල කරන විට ඔවුහු ජීව උන්ඩ යොදා වෙඩි තැබීමට පටන් ගත්හ.

"නන්දිග්‍රාමය ලෙයින් නැහැවෙයි - ඝාතක පිටියක් බවට පත් වෙයිඃ පොලිස් වෙඩි තැබීමෙන් 11 දෙනෙක් මිය යති" යන ශීර්ෂ පාඨය යටතේ *හින්දුස්ථාන් ටයිම්ස්* පුවත්පත පොලිස් ප්‍රහාරය මෙලෙස විස්තර කලේ යඃ "... ගම්වාසීන් පලා යාමට පටන් ගත් විට පොලිස් භටයෝ ඔවුන් පසුපස හඹා ගොස් කීප දෙනෙකු සිය නිවෙස්වලින් එලියට ඇද ගෙන අවුත් ඔවුන්ට පහර දුන්හ. 'ඒක යුද්ධයක් වගේ. මගේ පවුලේ අය කොහේ ගියා ද දන් නෑ,' යි ගම්වැසියෙකු වූ සබෙර් පැවසී ය. ලේ වැකුනු සිරුරු කුඹුරුවල හැම තැන ම විසිරී තිබුනා. තුවාල වූ අය උදව් ඉල්ලා කෑ ගසමින් සිටියත් පොලීස් නිලධාරීන් සිටියේ ඔවුන්ට පයින් ගහමින්.' "

මේ වන වට මරන සංඛ්‍යාව 14ක් දක්වා ඉහල ගොස් තිබෙන අතර පොලීසියේ ව්යරු සහගත ප්‍රහාරයෙන් බොහෝ දෙනා බරපතල තුවාල ලද තත්ත්වය යටතේ එය තවත් ඉහල යාමට ඉඩ තිබේ.

බදාදා පොලිස් ප්‍රහාරය සැලසුම් කොට ඊට අන කලේ සීපීඑම් නායකත්වයෙන් යුතු වාම පෙරමුනු ආන්ඩුවේ ඉහලම බලධරයන් ය. "නන්දිග්‍රාමයෙහි පවතින අනීතික වාතාවරනය" අවසානයකට ගෙන ඒමට - එනම්

ධනවාදී රාජ්‍යයේ අධිකාරය තහවුරු කිරීමට - නන්දිග්‍රාමයට කඩා වැදීම අවශ්‍ය වී ය යි කියමින් බටහිර බෙංගාල ප්‍රධාන අමාත්‍යවරයා මෙන් ම සීපීඑම්හි දේශපාලන කමිටු සාමාජිකයෙකු වන බුද්ධදාඩෙබ් භට්ටාචාර්ජි ද ඔහුගේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ද සීපීඑම්හි සමස්ත ඉන්දීය නායකත්වය ද යන මේ සියල්ලෝ මහ ඉහලින් එම ප්‍රහාරය ආරක්ෂා කරති, "ස්වයං ආරක්ෂාව" සඳහා ගත් පියවරක් ලෙස දක්වමින් පොලීසිය කල ජන ඝාතනය සම්බන්ධයෙන් නිදහසට කරුනු ඉදිරිපත් කරති.

පලමු කොට, නන්දිග්‍රාමයට කඩා වැදීමට ආරක්ෂාකාරී යුද ඇඳුම්වලින් සැරසී ගත් දහස් සංඛ්‍යාත පොලිස් භටයන්ට අන කිරීමට ආන්ඩුව ගත් තීන්දුව මගින් ද දෙවනුව, තුවාල ලැබූවන් හා මරනයට පත් වූවන් සම්බන්ධයෙන් ආන්ඩුව ම ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛන මගින් ද ස්වයං ආරක්ෂාව පිලිබඳ මෙම කියා පෑම් ව්‍යාජයක් බවට පත් කෙරේ. බ්‍රහස්පතින්දා බටහිර බෙංගාල පාර්ලිමේන්තුව හමුවේ භට්ටාචාර්ජි කල ප්‍රකාශයට අනුව, ගම්වාසීන් 14 දෙනෙකු ඝාතනයට ලක් වී තවත් කීප සංඛ්‍යාවක් තුවාල ලද මුත් තුවාල ලත් පොලිස් භටයන් සංඛ්‍යාව 12කට පමනක් සීමා විය. "සියලු පොලිස් නිලධරයන් ආරක්ෂක ඇඳුම්වලින් සැරසී සිටි හෙයින් බරපතල තුවාල ලැබීමෙන් වැලකීමට හා බොහෝ දෙනෙකුට තුවාල සිදු වීමෙන් බේරී ගැනීමට හැකියාව ලැබුනා."

ඕනෑ ම ප්‍රතිගාමී ධනේශ්වර තන්ත්‍රයක් විසින් ඉදිරිපත් කෙරෙන ආකාරයේ තර්ක ගෙන හැර පාමින් හා වාගාලාප බෙනෙමින් සීපීඑම් නායකත්වය නන්දිග්‍රාමයේ ඝාතනය යුක්ති සහගත කරන අතරවාරයේ, ස්ටැලින්වාදීන් විසින් අන කරන ලද පොලිස් මෙහෙයුමේ ප්‍රකෝපකාරී ස්වභාවය හා පැහැදිලි කෲරත්වය නිසා එය දේශපාලන කරලිය පුරා සිටින දේශපාලන පක්ෂ හා සංවිධානවල හෙලා දැකීමකට ලක් වී තිබේ.

පසු ගිය සතියේ "නන්දිග්‍රාමයෙහි පමන ඉක්මවා බලය යෙදීම" පිලිබඳව මෙන් ම ජනවාරියෙහි එහි මුදා හල ප්‍රචන්ඩත්වය පිළිබඳව ද ස්වාධීන පරීක්ෂනයක් පැවැත්විය යුතු යැයි ද පමන ඉක්මවා බලය යෙදීම ඇතුලු මානව අයිතීන් උල්ලංඝනය කිරීම්වලට වගකිව යුතු යැයි සැක කෙරෙන පොලිස් කාර්ය මන්ඩල සාමාජිකයන් ඇතුලු සියලු රාජ්‍ය නිලධරයන්ට එරෙහිව වහා ම නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ඉන්ඩියා ආයතනය කැඳවුම් කර තිබේ.

මධ්‍යම ආන්ඩුවෙන් පත් කරන ලද නිලධරයෙකු වන බටහිර බෙංගාල ආන්ඩුකාර ගෝපාල් ක්‍රිෂ්නා ගාන්ධි කියා සිටියේ, නන්දිග්‍රාමයේ සිදු වූ ඝාතන තම සිත " බලවත් තැති ගැන්මකින්" පුරවා ලූ බව යි. "මේ මිනිස් ලේ වැගිරීම වැලැක්වීමට හැකියාවක් තිබුනේ නැද්ද? ... දේශයට විරුද්ධ බලවේගවලට, ත්‍රස්තවාදීන්ට, අන්තවාදීන්ට හා කැරලිකරුවන්ට එරෙහිව බලය යොදනවා ය කියන්නේ එක දෙයක්. නන්දිග්‍රාමයේ දී යොදවන ලද බලයට නතු කෙරුනු පාර්ශ්වය එම වර්ගයන්ට අයත් වන්නේ නැහැ."

සීපීඑම්හි වාම පෙරමුනු සන්ධානයේ අනෙකුත් පක්ෂවලට පවා බටහිර බෙංගාල ආන්ඩුවේ ක්‍රියාවන්ගෙන් ඈත් වී ගැනීමට සිදු වී තිබේ. "මෙය වාම පෙරමුනේ ප්‍රතිරූපය කෙලෙසනවා පමනක් නෙවි, *එහි පැවැත්ම පවා අවදානමට ලක් කරනවා*" යි විප්ලවවාදී සමාජවාදී පක්ෂයේ නායකයා අනතුරු ඇඟවී ය (අවධාරනය ඇඳිනි). නන්දිග්‍රාම්හි දී පොලීසිය සිදු කල ක්‍රියාව "කෲර" හා "පිලිගත නොහැකි" තත්ත්වයක් ලෙස විස්තර කල ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ඒ.බී. බර්ධාන්, ගෝපාල් ක්‍රිෂ්නා ගාන්ධිගේ ප්‍රකාශ ප්‍රශංසාවට ලක් කලේ ය.

බටහිර බෙංගාල කොන්ග්‍රස් පක්ෂ නායක මනාශ් භූනියා බටහිර බෙංගාලය තුල ජනාධිපති පාලනය පැන විය යුතු යැයි කැඳවුම් කරනු පිනිස ජන ඝාතනය ඩැහැ ගත්තේ ය. ඒ අයුරින් ම, වාම පෙරමුනේ ඉඩම් අත්පත් කර ගැනීමේ වැඩ සටහනට විරුද්ධ බටහිර බෙංගාල ගොවීන්ගේ ව්‍යාපාරය තුල දී ඔවුන්ගේ සහායකයන් ලෙස කුහක වෙස් පාන හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) සහ ත්‍රිනමූල් (පොදු ජන) කොන්ග්‍රස් පක්ෂය ද ඡන්දයෙන් තේරී පත් වූ ප්‍රාන්ත ආන්ඩුව නෙරපා හරින ලෙස මධ්‍යම ආන්ඩුවෙන් ඉල්ලා තිබේ.

ඉන්දියාවේ එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) ආන්ඩුව මේ මොහොතේ එබඳු පියවරක් ගැනීමට පවතින ඉඩකඩ අල්ප ය. එසේ වන්නේ පාර්ලිමේන්තුවේ සිය බහුතරය රැක ගනු පිනිස යූපීඒය 60කටත් වැඩි වාම පෙරමුනු මන්ත්‍රීන්ගේ ඡන්ද මත රඳා සිටින නිසා පමනක් නො වේ.

මහජන විරුද්ධත්වය මධ්‍යයේ සිය "කාර්මීකරන" පිලිවෙත -- එනම්, ඉන්දියානු හා විදේශීය ආයෝජකයන් ආකර්ෂනය කර ගැනීම -- පෙරට තල්ලු කිරීමට බටහිර බෙංගාල ස්ටැලින්වාදී ආන්ඩුව දරන අධිෂ්ඨාන සහගත පරිශ්‍රමය දෙස කොන්ග්‍රස් පක්ෂ නායකත්වයෙන් යුතු යූපීඒය බලා සිටින්නේ නොඉවසිල්ලත් ප්‍රශංසාවත් මුසු වූ හැඟීමකින් යුතුව ය.

බටහිර බෙංගාල වාම පෙරමුන මෙන් ම යූපීඒය ද විශේෂ ආර්ථික කලාප පිහිටුවීම දකින්නේ, ලාභ ශ්‍රමය සොයා දිව යන ප්‍රාග්ධනය උදෙසා ඉන්දියාව ආකර්ෂනීය ස්ථානයක් බවට පත් කිරීමේ සිය සැලසුම්වල කේන්ද්‍රීය අංගයක් ලෙස ය.

(විශේෂ ආර්ථික කලාප යනු ඉඩම්, දිගු කාලීන බදු සහන, සහනදායක පරිසර හා කම්කරු නීති සහ, ආන්ඩුවේ තදබල පාලනයකට යටත් කල ලාභ ශ්‍රමය ආයෝජකයන් වෙත පිලිගන්වමින් චීන ආන්ඩුව ක්‍රියා කරන ආකාරය අනුගමනය කිරීමට ඉන්දියානු පාලක ප්‍රභූව දරන ප්‍රයත්නයකි. වේගයෙන් වර්ධනය වන කම්කරු පන්තියක් අධි සූරා කෑමකට ලක් කිරීම මගින් වඩ වඩාත් ධන සම්පත් රැස් කර ගැනීමට එක්සත් ජනපද, ජපාන හා යුරෝපා අන්තර් ජාතික සංගතවල හිමිකරුවන්ට සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ හා රාජ්‍ය නිලධරයේ තුනී ස්තරයකට හැකියාව ගෙන දෙමින් චීනයේ විශේෂ ආර්ථික කලාප ඩොලර් බිලියන සිය ගනනක ආයෝජන ආකර්ෂනය කර ගෙන තිබේ.)

ඉන්දියාවේ නව-ලිබරල්වාදී ප්‍රතිසංස්කරනවල ප්‍රධානතම අද්වකාත්වරයා යැයි කිව හැකි ඉන්දියානු අගමැති මන්මෝහන් සිං බටහිර බෙංගාල මහ ඇමතිවරයා සිය ප්‍රාන්තය කාර්මීකරනය කරනු පිනිස ප්‍රාග්ධනය ආකර්ෂනය කර ගැනීම කෙරෙහි යොමු කරන දැඩි අවධානය ප්‍රශංසාවට ලක් කලේ මීට දින කීපයකට පෙර ය. මන්මෝහන් සිං ඉන්දියානු පාර්ලිමේන්තුවේ පහල මන්ත්‍රී මන්ඩලය අමතමින් මෙසේ පැවසී යː "ආර්ථිකය වේගයෙන් කාර්මීකරනය කිරීම පිනිස ස්ථිරසාරව වැඩ කටයුතුවල යෙදී ගැනීමට කාලය පැමින ඇති බව මගේ මිතුරු බුද්දාඩෙබ් භට්ටාචාර්ජී කියන කොට ඔහු නිවැරදි යැයි මා අවංකව ම විශ්වාස කරනවා."

යූපීඒය බටහිර බෙංගාලයේ සීපීඑම් නායකත්වයෙන් යුතු වාම පෙරමුනු ආන්ඩුවට එරෙහිව ක්‍රියා නො කරනු ඇති වුවත් ඉන් අදහස් කෙරෙන්නේ මහ ව්‍යාපාරිකයන් තමන් වෙනුවෙන් වාම පෙරමුනු ආන්ඩුව සිදු කල කුරිරු ක්‍රියාවන් නරුම ලෙස යොදා ගනිමින් ඔවුන් තව තවත් දකුනට තල්ලු කිරීමට පියවර නො ගනු ඇත යන්න නොවේ. "බදාදා සිදු වූ මරන මෙන් ම කලින් සිදු වූ අඩු ගනනේ නවයක් පමන වූ මරන ද පක්ෂයේ ප්‍රතිසංස්කරන විරෝධී වාගාලාපවල සදාචාරාත්මක බව මොට කිරීමට" හේතු වනු ඇතැයි මාර්තු 15 දා ටයිම්ස් ඔෆ් ඉන්ඩියා පුවත්පත පැවසුවේ ප්‍රමුදිත හැඟීමකින් යුතුව ය.

බටහිර බෙංගාලයේ ගොවිජන කැරැල්ල අවුලුවා ලූයේ සිය දක්ෂිනාංශික හා නක්සලයිට් (මාඕවාදී) දේශපාලන විරුද්ධවාදීන් බවත් නන්දිග්‍රාමයේ ඉඩම් අත්පත් කර ගැනීමේ අවසන් වශයෙන් නියම කොට ගත් සැලසුමක් ආන්ඩුවට කිසි විටෙකත් නොතිබූ බවත් බටහිර බෙංගාල ආන්ඩුව හා ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂය කියා තිබේ. කෙසේ වුව එවන් ප්‍රතික්ෂේප කිරීම් මත කිසි සේත් විශ්වාසය තැබිය නොහැකි ය. සැබවින් ම ජනවාරි මස කැරැල්ල ඇවිලී ගියේ රසායනික නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම පිනිස සලිම් ගෲප් වෙත පවරා දීම සඳහා නන්දිග්‍රාමයේ ඉඩමක් වෙන් කිරීමේ ක්‍රියා දාමයකට ප්‍රාන්ත ආන්ඩුවේ අධිකාරයක් මුල පුරා ඇති බව ගම්වාසීන් දැන ගත් විට ය. එමෙන් ම, ප්‍රධාන අමාත්‍ය භට්ටාචාර්ජී ඉඩම් අත්පත් කර ගැනීම පිලිබඳ "නිවේදනය" ඉවත් කර ගැනීමට කැමැත්ත පල කල ද ඔහු එය තවමත් ප්‍රායෝගිකව අවලංගු කර නැත.

බදාදා ලේ වැකි සිදුවීම් සම්බන්ධයෙන් "ත්‍රිනමූල් [කොන්ග්‍රස්], නක්සලයිට් හා අනෙකුත් බලවේගවලට" වරද පැටවීමට ප්‍රයත්න දරමින් සීපීඑම් දේශපාලන මන්ඩලය තකහනියේ ප්‍රකාශයක් නිකුත් කලේ ය.

බටහිර බෙංගාලයේ ප්‍රධාන විරුද්ධ පක්ෂය වන ත්‍රිනමූල් කොන්ග්‍රසය බෙංගාලි ජාතිකවාදය සමග දුෂ්ට ප්‍රතිකොමියුනිස්ට්වාදය මුසු කල විවිධාකාර දක්ෂිනාංශික ජනතාවාදී ආයාචන ඉදිරිපත් කරයි. කොන්ග්‍රසයෙන් භේද වී ගිය කන්ඩායමක් වන එය ජාතික දේශපාලන කරලිය තුල දී බීජේපීයේ සහායකයෙකු ලෙස කටයුතු කරයි.

තමන්ගේ ම ප්‍රතිගාමී අරමුනු මුදුන්පත් කර ගැනීම පිනිස බටහිර බෙංගාල ගොවි ජනයාගේ දුක් ගැනවිලි ගසා කෑමට ත්‍රිනමූල් කොන්ග්‍රසය නිසැකව ම උත්සාහ කරයි. එහෙත් සින්ගුර්හි මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම සඳහා ඉඩම් නිදහස් කර ගැනීමේ දී ටාටා සමාගම වෙනුවෙනුත් නන්දිග්‍රාම්හි දී සලීම් ගෲප් වෙනුවෙනුත් කටයුතු කිරීම මගින්, ත්‍රිනමූල් කොන්ග්‍රසයේ වාචාල නායිකා මමතා බැනර්ජී වැනි අයට වේදිකාවක් සම්පාදනය කර දී ඇත්තේ, සීපීඑම් හා වාම පෙරමුන ම ය.

එමෙන් ම, බදාදා ජන ඝාතනය යනු, මහ ව්‍යාපාරිකයන් වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමත් විරුද්ධවාදීන් මර්දනය කිරීමත් සඳහා ඍජු ප්‍රචන්ඩත්වය මෙන් ම බ්‍රිතාන්‍ය විජිත පාලකයන් විසින් පනවන ලද නීති ද යොදා ගනිමින් සීපීඑම් නායකත්වයෙන් යුතු වාම පෙරමුනු ආන්ඩුව යටතේ එල්ල කල රාජ්‍ය ප්‍රහාර මාලාවක කුට ප්‍රාප්තිය යි.

සීපීඑම් නිකුත් කල ප්‍රකාශයේ දී, ඊනියා පිටස්තර බලවේගවලට එරෙහිව ඒකාබද්ධව නැගී සිටින ලෙස තම පිලිවෙත් නිසා කැරලිකාරී වූ ගම්වාසීන්ට ම එය ආයාචනා කලේ, ගම්වාසීන්ගේ "පිටස්තරයන්" බවට පත් වී ඇත්තේ වාම පෙරමුනු ආන්ඩුව ම ය යන කරුන මග හරිමිනි.

භට්ටාචාර්ජී හා ඔහුගේ සගයන් වන ස්ටැලින්වාදීන් කියා පාන්නේ නන්දිග්‍රාමයේ, සින්ගුර්හි හා විශේෂ ආර්ථික කලාප පිහිටුවීම සඳහා නියම කර ඇති අනෙක් තැන්වල සිටින ගම්වාසීන්ට ධනවාදී සංවර්ධනයෙන් ප්‍රතිලාභ අත් වනු ඇති බව යි.

සැබවින් ම, ඉන්දියාව තුල පසු ගිය 15 වසරක් තිස්සේ සිදු කල නව-ලිබරල් ප්‍රතිසංස්කරන මගින් පෙන්නුම් කර ඇත්තේ ධනවාදී සංවර්ධනය සමාජ-ආර්ථික ජීවිතයේ සියලු අංශ මත මහ ව්‍යාපාරිකයන්ගේ ග්‍රහනය ශක්තිමත් කරන බව යි, දුප්පතුන් හා පොහොසතුන් අතර පෙර නොවූ තරමේ පුලුල් පරතරයක් වර්ධනය කරන බව යි, එමෙන් ම දරිද්‍රතාව හා ආර්ථික අනාරක්ෂිතතාව වැඩි දියුනු කරන බව යි.

එමෙන් ම, නූතන කර්මාන්ත තුල රැකියා අවස්ථා හිමි කර ගැනීම සඳහා අවශ්‍ය නිපුනතාවන් තමන්ගෙන් බොහෝ දෙනෙකුට නොමැති බවත් ජීවනෝපාය මාර්ගයක් නැති තත්ත්වයකට තමන් පත් කරමින් ආන්ඩුව පිරිනමන මූල්‍ය වන්දිය පරිභෝජනය සඳහා වැය වී ඉක්මනින් ම අවසන් වනු ඇති බවත් නන්දිග්‍රාම් ගොවීහු හොඳින් ම දනිති.

නන්දිග්‍රාම්හි ජන ඝාතනය, ඉන්දියාවේ කම්කරුවන් හා පීඩිත ජනයා ආරක්ෂා කරන්නේ ය යන වාම පෙරමුනු ආන්ඩුවේ හා ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ මවා පෑම කීතු කර දමා, ඔවුන් කම්කරු ජනයාට එරෙහිව ප්‍රචන්ඩ රාජ්‍ය මර්දනය දිගේලි කරනු පිනිස අප්‍රමාදීව නැගී සිටින, දේශීය හා ජාත්‍යන්තර ධනවාදයේ ඒජන්තයන් බව ඔප්පු කර තිබේ.

© www.wsws.org